# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/239/2024 (NPC)**

එස්.එම්.ඒ.පී.කේ.සමරකෝන්
**අභියාචක**

**එදිරිව,**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.03.03**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් රජයේ සේවක ඩී.ආර්.ඩී.යූ.දිසානායක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය.

**-<u>නියෝගය</u>-**

දෙපාර්ශවයම විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට සවන් දුනිමු.

පසුගිය දින එනම්, 2026.01.29 දින මෙම අභියාචනය විමසීමට ගත් අවස්ථාවේදී අභියාචකගේ ඉල්ලීම වූයේ ඔහුට ලබා දී ඇති දඬුවම අඩු කර දෙන ලෙසයි. ඒ සඳහා හේතු දක්වන ලෙස අභියාචකට දැනුම් දෙමින්, එම කරුණ අද දිනට විමසීමට නියම කරන ලදී. අභියාචක වෙත නිකුත් කර ඇති විනය දඬුවම වූයේ, 2024.09.25 දිනැති ලිපිය මඟින් නිකුත් කර ඇති, වැටුප් වර්ධක එකක් විලම්භනය කිරීමයි. ඊට අමතරව ආධුනික කාලය වසරකින් දීර්ඝ කරන ලෙසත්, ඉහත කී දඬුවම පැමිණ වීමට හේතු වූ රිය අනතුරට භාජනය වූ යතුරු පැදියට වූ අලාභයද ගෙවන ලෙසත් වැඩිදුරටත් නියෝග කර ඇත. තවද මෙම අභියාචක වැඩ තහනමකට ලක් කර සිටි කාලයට අදාළව අත්හිටුවා ඇති වැටුප් හා දීමනා අහිමි කිරීමටත් නියෝග කර ඇත.

ඉහතින් සඳහන් කරන ලද ආධුනික කාලය දීර්ඝ කිරීමත්, අලාභ මුදල් ගෙවීමත් සහ වැඩ තහනමට ලක් කර සිටි කාලයට අදාළව වැටුප් නොගෙවීමත් යන සියලුම දඬුවම් දැනටමත් ක්‍රියාත්මක කර අවසන් වී ඇත. එබැවින් නියම කර ඇති දඬුවම්වලින් ඉතිරිව ඇති එකම දඬුවම වන්නේ, වැටුප් වර්ධකයක් විලම්භනය කිරීම යන දඬුවම පමණි.

ඉහත කී දඬුවම අඩු කර දෙන ලෙස පමණක් අභියාචක විසින් ඉල්ලා ඇත. එම කරුණ සම්බන්ධයෙන් විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කිරීමෙන් අනතුරුව පෙනී ගියේ, මෙම සිද්ධිය හේතුවෙන් අභියාචක දැනටමත් බරපතල ලෙස දඬුවමකට යටත් වී ඇති බවයි. සිදුව ඇති සිද්ධිය වූයේ යතුරු පැදියක් සේවා ස්ථානය සඳහා ගෙන යාමේදී අභියාචක විසින් නිසි අවසරයකින් තොරව ධාවනය කර තිබීමයි. ඒ අවස්ථාවේදී යතුරු පැදිය ධාවනය කිරීම ආරම්භ කර ඇත්තේ, ඒ සඳහා ප්‍රවීන සුදුසුකම්ලත් පොලිස් කොස්තාපල්වරයකු විසිනි. ටික වේලාවකින් අනතුරුව අභියාචක එය පැදවීමට කටයුතු කිරීමෙන් අනතුරුව, මෙම සිද්ධිය සිදු වී ඇත. රජයට සිදු වූ අලාභ මේ වන විටත් ගෙවා අවසන් කර ඇත.

ඒ වන විට මෙම අභියාචක ආධුනික කාලය තුළ සේවය කරමින් සිට ඇත. සේවය අහිමි වී සිටි කාලය තුළ කිසිදු වැටුපක් හෝ දීමනාවක්ද ගෙවා නැත. මේ වන විට අභියාචක රිය ධාවනය කිරීම සඳහා පොලිසිය මඟින් නිකුත් කරනු ලබන ප්‍රවීනතා බලපත්‍රයද ලබා ගෙන ඇත. ඒ බව තහවුරු කිරීමට අවශ්‍ය ලේඛනද ඉදිරිපත් කර ඇත. ඉහත කරුණු අනුව පෙනී යන්නේ අභියාචකගේ වැටුප් වර්ධකයක් අත්හිටුවීම නිසා, ඔහු බරපතල ලෙස දඬුවමකට ලක් වී ඇති බවයි. දැනට පවතින වැටුප් වර්ධකයක් අහිමි කිරීමේ දඬුවම අභියාචකගේ ඉදිරි සේවා කාළය මුළුල්ලේම බලපැවැත්වෙනවා ඇත. එම දඬුවම විශ්‍රාම යාමේදී පවා සළකනු ලබන කරුණකි. මෙම සිද්ධිය හා සළකා බලන විට, එම දඬුවම බරපතල ලෙස ක්‍රියාත්මක වනවා ඇත.

ඉහත කරුණු එසේ වුවද, මෙහිදී විශේෂයෙන්ම සලකා බලන ලද්දේ, පොලිස් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති, පොලිස් දෙපාර්තමේන්තු

නියෝගවල ආධුනික කාලපරිච්ඡේදය තුළ සිටින නිළධාරීන් සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමේදී කටයුතු කළ යුතු ආකාරය දැක්වෙන කරුණුය. එකී දෙපාර්තමේන්තු නියෝගවල 13 වන නියෝගයේ විශේෂයෙන්ම සඳහන් වන්නේ, ආධුනිකත්වයේ සිටින නිළධාරීන්ට දඬුවම් කිරීමේදී සැලකිය යුතු කරුණුය. ඒ අනුව A8 දරන පොලිස් දෙපාර්තමේන්තු නියෝගයේ 13 වන පරිච්ඡේදයේ සඳහන් වන්නේ ආධුනිකත්වයේ සිටින නිළධාරීන්ගේ විනය පිළිබඳ කටයුතුවලදී අනුගමනය කළ යුත්තේ, අවවාද අනුශාසනා කොට ඒවා ඔවුන්ගේ ප්‍රගති ලිපි ගොනුවල සටහන් තබමින් කටයුතු කිරීම බවයි. ඒ සමඟම එහි සඳහන්ව ඇත්තේ, සේවා ලේඛනයෙහි නරක සටහන් ලිවීමෙන් වැළකිය යුතු බවත්ය. එසේ ලියතොත් ලිවිය යුත්තේ, ඉතාම කලාතුරකින් බවටද එහි වැඩි දුරටත් සඳහන් වේ.

ආධුනිකත්වයේ සිටින නිළධාරීන් යහ මඟට යොමු කරමින් සේවයේ රඳවා ගැනීම සඳහා එම නියෝග අරමුණු කරගෙන ඇති බව පෙනී යයි. ඒ අනුව නියම කරන අවවාද අනුශාසනා නොපිළිගන්නේ නම් පමණක් ආධුනිකත්වයේ සිටින නිළධාරියාගේ සේවය අවසන් කළ යුතු බවටද එහි සඳහන් වේ. මෙම නිළධාරියාගේ සේවය අවසන් කිරීමට කටයුතු කර නැත. එසේ නම් කළ යුතුව තිබුණේ අවවාද අනුශාසනා කිරීම පමණි. ඒ අනුව මෙහිදී ඉහත කී පොලිස් දෙපාර්තමේන්තු නියෝග අනුව කටයුතු කිරීම සුදුසු බව පෙනී යයි.

තවද මේ අවස්ථාවේදී විනිශ්චය අධිකාරයේ අවධානය යොමු වන්නේ, මෙම සිද්ධිය නිසා කිසිදු භාහිර පාර්ශ්වයකට තුවාල හෝ අලාභයක් සිදුවී නොමැති බවයි. ඉහත කී හේතූන් සළකා බලා අභියාචක වෙත නිකුත් කර ඇති වැටුප් වර්ධකයක් විලම්භනය කිරීම යන දඬුවම ඉවත් කරමු. අභියාචක දැනටමත් සේවයේ ස්ථිර බවට පත් කර ඇති නිසා, ඉහත කී රෙගුලාසියේ සඳහන් පරිදි අවවාදයක් නිකුත් කිරීම යන කරුණ පැන නඟින්නේද නැත.

ඉහත හේතූන් සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට ඉඩ දෙමු. ඔහු වෙත 2025.09.25 දින ලිපිය මඟින් නිකුත් කර ඇති වැටුප් වර්ධකයක් විලම්භනය කිරීම යන දඬුවම ඉවත් කරමු. මෙම තීරණය

ක්‍රියාත්මක කරන ලෙස ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත වැඩි දුරටත් නියෝග කරමු.

අභියාචකගේ අභියාචනයට ඉඩ දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/